# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
# வியாபாரமற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
# Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය,කොළඹ - 01
செயலகம்,கொழும்பு - 01
The Secretariat, Colombo -01

**මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය**
**நிதி, பொருளாதாரம் மற்றும் கொள்கைஅபிவிருத்திஅமைச்சு**
**Ministry of Finance,Economy and Policy Development**


මගේ අංකය / எனது இல. / My No. } TIP/SS/01/02 T

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2020.01. 27

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් වෙත

**සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**
**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 විධිවිධාන පිළිබඳ පැහැදිලි කිරීම**

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හි 7.ii, 8.3 හා 8.4 වගන්තීන්හි විධිවිධාන පිළිබඳව පහත සඳහන් පැහැදිලි කිරීම් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

(i). 7.ii වගන්තිය:

*"බලපත්‍රයක් ලබා ගැනීම සඳහා නිලධාරියා සුදුසුකම් ලබන බව තහවුරු කිරීම පිණිස ඔහු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය යැයි තහවුරු වුවහොත් නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී වාහනයක් ලබාගෙන ඇත්නම් ඒ සම්බන්ධයෙන් අදාළ වන නීති යටතේ කටයුතු කරනු ඇත. එසේම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නීතිමය අයුරින් සහ විනයානුකූලවද කටයුතු කරනු ලැබේ."*

පැහැදිලි කිරීම:-

යම් නිලධාරියෙකු බලපත්‍රය ලබා ගැනීම සඳහා සපයනු ලබන තොරතුරු සාවද්‍ය යැයි තහවුරු වුවහොත් නිකුත් කළ බලපත්‍රය වහාම අවලංගු කළ යුතු වේ. බලපත්‍රයක් සඳහා වාහනයක් ආනයනය කර/ මිලදීගෙන ඇත්නම්, අදාළ බදු පනත්හි විධිවිධානයන්ට අනුකූලව, බලපත්‍රය ලබා දීම හේතුවෙන් රජයට අහිමි වූ බදු ආදායම අය කර ගැනීමට කටයුතු කළ යුතුය. සාවද්‍ය තොරතුරු සැපයීම මත ආයතන සංග්‍රහයෙහි හා/හෝ ඒ ඒ ආයතනයන්හි භාවිතයට ගනු ලබන පාලන විධිවිධාන හෝ නීති රීති අනුව, අයදුම් කළ නිලධාරියාට, නිර්දේශ කළ නිලධාරියාට (8.3 වගන්තිය අනුව) හා බලපත්‍රය නිකුත් කළ නිලධාරියාට (9.2 වගන්තිය අනුව) එරෙහිව විනයානුකූල පියවර ගත යුතු වේ. තවද ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි අවශ්‍ය වන්නේ නම් රටේ සාමාන්‍ය නීතිය අනුව නීතිමය කටයුතු ආරම්භ කළ යුතුය.

(ii). 8.3 වගන්තිය:

*"බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ බලපත්‍ර ලාභියා විසින් අයදුම්පතෙහි ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන බැවින්, එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව හා ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය නොවන බවට තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් විසින් අයදුම්පත්‍රය නිර්දේශ කළ යුතු අතර බලපත්‍රය නිකුත් කිරීමට ප්‍රථම බලපත්‍ර නිකුත් කරනු ලබන නිලධාරියාද ඒ පිළිබඳව සෑහීමකට පත්විය යුතුය"*

පැහැදිලි කිරීම:-

අදාළ අයදුම්කරු විසින් චක්‍රලේඛයේ 8.1 වගන්තිය අනුව, ඇමුණුම III යටතේ ඇති අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර, බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට තමාට සුදුසුකම් ඇත්දැයි තහවුරු කර ගැනීමෙන් පසු එම සුදුසුකම් තහවුරු කිරීමට අවශ්‍ය ලේඛණ සමඟ අයදුම්පත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවට නිර්දේශ කිරීමේ හා අනුමත කිරීමේ කාර්යයේ යෙදෙන නිලධාරීන් සෑහීමකට පත්විය යුතුය.

තවද, ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයක් නිර්දේශ කිරීමේදී හා අනුමත කිරීමේදී අයදුම්පත් ආකෘතියට අනුව එක් ප්‍රකාශනයක් තෝරා ගැනීමට අවශ්‍යයෙන්ම කපා හැරිය යුතු වචන හැර වෙනත් වචන කපා හැරීම, මකා දැමීම හා/ හෝ අළුතින් වචන එකතු කිරීම සිදු නොකළ යුතුය.




දුරකථන අංකය / தொலைபேசி / Telephone } 0112 484 888
ෆැක්ස් / தொலைநகல் / Fax } 0112484 962 / 0112 484 830
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail } admin@tipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.treasury.gov

(iii). 8.4 වගන්තිය:

*"මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෙම චක්‍රලේඛයේ "ඇමුණුම II" මඟින් දක්වා ඇති ආයතනවල ලේකම්වරුන් හට මෙයින් බලය ලබා දෙනු ලැබේ. එලෙස නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම පිටපත් පහත අයුරින් අදාළ ගොනුවලට සහ ආයතන වෙත බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේදීම යොමු කළ යුතුය."*

පැහැදිලි කිරීම:-

ඉහත වගන්තියේ සඳහන් පරිදි බලපත්‍ර නිකුත් කිරීමේ සමස්ථ කාර්යය හෝ ඉන් කොටසක් සිදු කිරීම රාජකාරි බහුලත්වය මත ප්‍රායෝගිකව අපහසු යැයි අදාළ ලේකම්වරයා තීරණය කරන්නේ නම්, බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යයේ බලය සුදුසු අතිරේක ලේකම්වරයෙක් වෙත පැවරීමට හැකියාව ඇත. කෙසේ වුවද, එසේ බලය පැවරීමක් සිදු කරන විට චක්‍රලේඛයේ සියළු අවශ්‍යතා සපුරන සුදුසුකම්ලත් නිලධාරීන්ට පමණක් බලපත්‍ර නිකුත් කිරීම සිදු වන බවට අදාළ ලේකම්වරයා විසින් වගබලාගත යුතු වේ. එසේ බලපත්‍ර අත්සන් කිරීමේ බලය වෙනත් නිලධාරියෙකු හට පවරන්නේ නම් ඒ පිළිබඳ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා විගණකාධිපති දැනුවත් කළ යුතු වේ.

ඉහත කරුණු සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විමසිය යුතු වේ.

ජේ.ඒ. විමලේන්ද්‍රරාජා
අධ්‍යක්ෂ ජනරාල්

අ.කළේ/ එස්.ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්